ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.05.13 |

කේ.ජී.චන්ද්‍රරත්න මයා,
ඉදිගොල්ල වත්ත,
හුම්බුළුව,
අලව්ව.

*පැමිණිලි පාර්ශවය*

කේ.ජී.යූ.ඒෂාන් කස්තුරි (වයස අවු : 12),
6 බී ශ්‍රේණිය,
ව/ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලය.

*වින්දිත පාර්ශවය*

1. අනෝමා රණසිංහ මිය ,
   ප්‍රායෝගික තාක්ෂණ විෂය භාර ගුරු,
   ව/ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලය.

2. විදුහල්පති,
   ව/ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලය.

3. අධ්‍යක්ෂ
   කලාප අධ්‍යාපන කාර්යාලය
   ගිරිඋල්ල.

*වගඋත්තර පාර්ශවය*

**පැමිණිලි අංකය - HRC/3290/25**

**පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් 2025.09.22 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සහ පසුව ඉදිරිපත් කරන ලද කරුණුවල සාරාංශය මෙසේය.

පැමිණිලිකරුගේ පුත්‍රයා වන ව/ගිරි හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලයේ 6-බී ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.ජී. උදාන්ත ඒෂාන් කස්තුරි සිසුවාට, 2025.08.28 වන දින එම විද්‍යාලයේ අනෝමා රණතුංග නම් ගුරුතුමිය විසින් පන්ති කාමරය තුළදී පහර දී ඇත. පැමිණිල්ලේ සඳහන් වන පරිදි, අදාළ ගුරුතුමිය විසින් දරුවාගේ හිසට බර සහිත පොතකින් කිහිප වරක් පහර දී ඇති අතර, මීට අමතරව කම්මුල් පහරවල් කිහිපයක් ද එල්ල කර ඇත. මෙම ප්‍රහාරය හමුවේ දරුවාට ක්ලාන්ත ගතිය සහ පෙනීමේ

අපහසුතාවක් (ඇස් නොපෙනී යන ස්වභාවයක්) ඇති වී තිබෙන අතර, ඔහු සිය හිස මේසය මත තබාගෙන දැඩි අපහසුවෙන් පසුවී ඇත. දරුවාට ඇති වූ හිසේ සහ කම්මුල්වල වේදනාව හේතුවෙන් පන්ති භාර ගුරුතුමිය විසින් දරුවාට ආලේප කිරීම සඳහා 'සිද්ධාලේප' ලබා දී ඇති බව ද සඳහන් වේ.

පසුදින, එනම් 2025.08.29 වන දින ද අනෝමා රණතුංග ගුරුතුමිය විසින් දරුවාට පන්ති කාමරය තුළදී මානසිකව පීඩා වන අයුරින් බැණ වැදී ඇති අතර, ***"තෝ මරනවා, මරලා පොලිසි ගෙන යනවා"*** යනුවෙන් පවසමින් දරුවා දැඩි භීතියකට පත් කර ඇත. මේ සම්බන්ධයෙන් 2025.09.01 වන දින පැමිණිලිකරු සහ දරුවාගේ මව විද්‍යාලයේ විදුහල්පති සහ නියෝජ්‍ය විදුහල්පතිනිය හමුවී සාකච්ඡා කර ලිඛිත පැමිණිල්ලක් ද ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු පෙන්වා දෙන්නේ, ඔවුන් විදුහල්පති කාර්යාලයේ සාකච්ඡා කරමින් සිටි අවස්ථාවේදී පවා අදාළ ගුරුතුමිය පන්තියට ගොස් දරුවා සොයා ඇති බවයි. එහිදී ඇය පන්තියේ සිටි අනෙක් සිසුන්ට, ***"උදාන්ත ආවා නම් පරිස්සමෙන් ඉන්න කියපල්ලා, ඌට කරන දේ මම කරනවා"*** යනුවෙන් පවසා තර්ජනය කර ඇත. මේ පිළිබඳව බියට පත් සිසුන් විදුහල්පති කාර්යාලයට පැමිණ පැමිණිලිකරු ඉදිරියේම විදුහල්පතිවරයාට කරුණු වාර්තා කර ඇති අතර, එම ප්‍රකාශයන් පැමිණිලිකරු විසින් සිය දුරකථනයෙන් පටිගත කර (CD තැටියක් ලෙස) කොමිෂන් සභාව වෙත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇත. විදුහල්පතිවරයාගේ උපදෙස් මත මේ පිළිබඳව පොලිසියට ද පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු කටයුතු කර ඇත.

තවද, මෙම විමර්ශන ක්‍රියාවලිය සිදුවන අතරතුර, දුරකථනයෙන් පැමිණිලිකරු වෙත මරණ තර්ජන එල්ල වී ඇත. පොලිසියේ සේවය කරන බව කියන වගඋත්තරකරුගේ ඥාතියෙකු එම ඇමතුම ලබා දෙමින්, ***"තමාගේ සියලු දේ විනාශ කරන බවටත්, අනෝමා ගුරුතුමියට එරෙහිව කටයුතු නොකරන ලෙසත්"*** පවසමින් තර්ජනය කර ඇති බව පැමිණිලිකරු සඳහන් කරයි. ඒ අනුව, මෙම සිදුවීමට වගකිව යුතු ගුරුතුමියට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පවත්වා සාධාරණය ඉටු කරන ලෙස පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් සහනය ලෙස අපේක්ෂා කර ඇත.

**<u>වින්දිත ශිෂ්‍යයාගේ ප්‍රකාශය</u>**

2025.11.18 වන දින පවත්වන ලද විමර්ශනයේදී ව/ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලයේ 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන වින්දිත කේ.ඒ. උදන්ත හේෂාන් කස්තුරි ශිෂ්‍යයා ප්‍රකාශ කර ඇත්තේ, සිද්ධිය වූ දින ඔහු පන්තියෙන් බැහැරව සිට නැවත පන්ති කාමරයට පැමිණෙන අවස්ථාව වන විට පන්තියේ අනෙකුත් සිසුන් ක්‍රීඩා කිරීමට යාම සඳහා කැමැත්ත පළ කරමින් අත් ඔසවාගෙන සිටි බවයි. තමා ද ඒ සඳහා අත එසවීමට උත්සාහ කිරීමේදී අතේ තිබූ පෑන බිම වැටුණු බවත්, එය අහුලා ගැනීම සඳහා පහත් වූ අවස්ථාවේදී ගුරුවරිය විසින් පොතකින් තමාගේ හිසට පහරක් එල්ල කළ බවයි. ඉන් අනතුරුව ගුරුවරිය සිය අතින් තමාගේ දකුණු පස කම්මුලට ද දෙවතාවක් පහර දුන් බවත්, එම පහරදීමෙන් ඇති වූ වේදනාව හේතුවෙන් තමා මේසය මත හිස තබාගෙන සිටි බවත් ඔහු ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී පන්ති කාමරය තුළ සිටි අදාළ ගුරුවරියට නින්ද ගොස් සිටි බැවින් පන්තියේ අනෙකුත් ළමුන් ඒ පිළිබඳව සිනහ වූ බවත්, ඉන් කෝපයට පත් ගුරුවරිය පන්ති කාමරයෙන් පිටතට ගිය බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත. පසුව තමා පන්ති භාර ගුරුතුමිය දැනුවත් කළ බවත්, ඇය විසින් හිසේ වේදනාව සඳහා 'සිද්ධාලේප' ආලේප කිරීමට ලබා දුන් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තව ද වැඩිදුරටත් කරුණු දක්වමින්, එදින සවස ඔහු නිවස අසල ළමුන් කිහිප දෙනෙකු සමඟ 'ටින් කැඩීමේ' ක්‍රීඩාවේ නිරත වූ බවත්, එහිදී සැඟවී සිටි ළමුන් සොයා ගැනීම සඳහා ක්‍රීඩා කළ පිරිස විසින් 'හූ' හඬක් නැගූ බවත්ය. එහිදී 'සිතුම්' සහ 'ජනිත්' යන සිසුන් ගුරුවරියගේ ඉඩම දෙසට ගියද, ඔහු හෝ තම සහෝදරිය එම ඉඩමට ඇතුළු නොවූ බවයි. එහෙත් එම 'හූ' හඬ තමාට එරෙහිව සිදු කළ එකක් බව වැරදියට වටහා ගත් ගුරුවරිය තම සහෝදරියට බැණ වැදුණු බව ද සඳහන් කර ඇත. එසේම, පසුදින

අදාළ ගුරුවරිය 6-ඒ පන්තියේ උගන්වමින් සිටියදී තමා සිටි පන්තියට පැමිණ, *"තෝ මරනවා, පොලිසියට අල්ලලා දෙනවා"* යනුවෙන් මරණීය තර්ජනය කරමින් බැණ වැදුණු බවද, තමා මේ පිළිබඳව පන්ති භාර ගුරුතුමිය දැනුවත් කිරීමෙන් පසු ඇයගේ උපදෙස් මත විදුහල්පති කාර්යාලය වෙත ගොස් නියෝජ්‍ය විදුහල්පතිතුමිය හමුවී කරුණු ඉදිරිපත් කළ බවයි. මෙම සිද්ධිය හේතුවෙන් ඇති වූ ශාරීරික හා මානසික පීඩාව මත තමා රෝහල්ගතව ප්‍රතිකාර ලැබූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

**1. පළමුවන වගඋත්තරකාරියගේ ප්‍රකාශය - අනෝමා කුමාරි රණතුංග (ගුරුතුමිය)**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් 2025.11.26 දින පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, තමා අදාළ පාසලේ ප්‍රායෝගික තාක්ෂණ කුසලතා විෂය ඉගැන්වීම් කටයුතු සිදු කරන බවත්, ඇයගේ සමස්ත සේවා කාලය වසර 30ක් වන අතර වසර 11ක් පුරා හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලයේ සේවය කර ඇති බවත්ය. 2025.08.28 වන දින තමා 6-බී ශ්‍රේණියේ 6 වන කාලපරිච්ඡේදයේ ඉගැන්වීම් කටයුතු සඳහා සහභාගී වූ බවත්, එහිදී උදන්ත හේෂාන් කස්තුරි යන ශිෂ්‍යයා තමා ලබාදුන් පැවරුම් ඉටු කර නොමැති බව පොත් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ බවත් සඳහන් කර ඇත. ඒ පිළිබඳව විමසා, සිසුවාගේ පොතෙන් ඔහුගේ පිට ප්‍රදේශයට එක් පහරක් ගැසූ බවත්, අනතුරුව පොත සිසුවා අතට දී ඔහුගේ කම්මුල අතගා *"ගිහින් ලියන්න"* ලෙස පැවසූ බවත් සඳහන් කර ඇත. කෙසේ වුවද, පැමිණිල්ලේ සඳහන් පරිදි සිසුවාගේ කම්මුලට පහර දුන් බවට එල්ල වන චෝදනාව ඇය විසින් තරයේ ප්‍රතික්ෂේප කර ඇත.

එමෙන්ම, පැමිණිලිකාර පාර්ශවය චෝදනා කරන පරිදි වගඋත්තරකාරිය විසින් අදාළ ශිෂ්‍යයාට කිසිදු මරණ තර්ජනයක් සිදු කර නොමැති බව ද සඳහන් කර ඇත. තම නිවස සහ ශිෂ්‍යයාගේ නිවස එකිනෙකට ආසන්නව පිහිටා ඇති බවත්, දෙපාර්ශවය අතර පොදු මාවතක් සම්බන්ධයෙන් පෞද්ගලික ආරවුලක් පවතින බවත් සඳහන් කර ඇත. 2025.08.28 දින සවස අදාළ ශිෂ්‍යයා තවත් ළමුන් කිහිප දෙනෙකු සමඟ නිවස ආසන්නයේ පන්දු කෙළියක නිරතව සිටියදී, එක් පන්දුවක් තම වත්තට වැටුණු බවත්, එවිට ශිෂ්‍යයා වැටෙන් පැන වත්තට ඇතුළු වී එම පන්දුව රැගෙන ගිය බවත්ය. එම අවස්ථාවේදී තමා ගේට්ටුව අසලට ගොස්, *"පාරේ අපට යන්නට ඉඩ නොදෙන අය අපේ වත්තට පැන බෝල රැගෙන යන්නේ කෙසේද?"* යන්න ප්‍රශ්න කළ බවත්, එවිට එම ස්ථානයේ ක්‍රීඩා කළ ළමුන් තමාට *'හූ'* තැබූ බවත් ඇය සඳහන් කර සිටියාය.

පසුදින (2025.08.29) තමා 6-ඒ පන්තියේ උගන්වමින් සිටියදී, වින්දිත ශිෂ්‍යයා සිටින පන්තියේ ළමුන් ශබ්ද කළ බැවින් ඔවුන් නිශ්ශබ්ද කිරීම සඳහා එම පන්තියට ගිය බවත්ය. එහිදී පෙර දින සවස අදාළ ශිෂ්‍යයා තමාට *'හූ'* තැබූ බව සිහිපත් වූ බැවින්, සිසුවා අසලට ගොස් *"ඔයා මට හූ කිව්වා නේද? මීට පස්සේ මේ වගේ වැඩ කළොත් පොලිසියට කියනවා"* යනුවෙන් අවවාද කළ බවත්, ඉන් පරිබාහිරව කිසිදු තර්ජනයක් සිදු නොකළ බවත් වගඋත්තරකාර ගුරුවරිය වැඩිදුරටත් සඳහන් කර ඇත.

**02. දෙවන වගඋත්තරකරු - විදුහල්පති, ව/ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලය**

විදුහල්පතිවරයා විසින් 2025.11.03 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව, 6-බී පන්තියේ ඉගෙනුම ලබන කේ.ඒ. උදාන්ත ඒෂාන් කස්තුරි සිසුවාට අනෝමා රණතුංග ගුරුතුමිය විසින් පහර දුන් බවට 2025.09.01 වන දින පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ විසින් විදුහල්පතිවරයා වෙත

පැමිණිලි කර ඇත. ඒ සම්බන්ධයෙන් වින්දිත සිසුවා සහ තවත් සිසුන් තිදෙනෙකු කැඳවා විමසීම් කර ඇති අතර, නියෝජ්‍ය විදුහල්පතිතුමිය ද මැදිහත් වී ගැටලුව නිරාකරණය කිරීමට උත්සාහ කර ඇත. එහෙත්, අදාළ ගුරුතුමිය සහ පැමිණිලිකරුගේ පවුල අතර පවතින පෞද්ගලික ඉඩම් ආරවුලක් හේතුවෙන් පාසල් මට්ටමින් එම ගැටලුව විසඳීමට නොහැකි වී ඇත.

පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම පරිදි ගුරුවරිය ස්ථාන මාරු කිරීමට පාසලට බලයක් නොමැති බව දැනුම් දීමෙන් පසු පැමිණිලිකරු පොලිසිය වෙත යොමු වී ඇත. ඒ අනුව අලව්ව පොලිස් ස්ථානය මඟින් විමර්ශනයක් පවත්වා, 2025.09.03 වන දින පාසලට පැමිණ සිසුන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, අනෝමා රණතුංග ගුරුතුමිය අත්අඩංගුවට ගෙන පසුදින පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. විදුහල්පතිවරයා මේ පිළිබඳව ගිරිඋල්ල කලාප අධ්‍යාපන බලධාරීන් දැනුවත් කර ඇති අතර, සිද්ධියෙන් පසු අදාළ ගුරුතුමිය එම පන්තියේ ඉගැන්වීම් කටයුතු වලින් ඉවත් කර දරුවා සහ ගුරුවරිය මුණ නොගැසෙන පරිදි කටයුතු කර ඇති බව දන්වා ඇත.

**03. තෙවන වගඋත්තරකරු - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගිරිඋල්ල**

ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලය නියෝජනය කරමින් සහභාගී වූ විමර්ශන නිලධාරී විසින් 2025.11.26 වන දින පවත්වන ලද විමර්ශනයේදී කරුණු දක්වමින්, අදාළ පහරදීමේ සිදුවීම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති බවත්, ඒ පිළිබඳව 2025.10.23 දිනැති අංක ව/අධ්‍යා/ගිරි/විම/01/25/31 දරන ලිපිය මඟින් දැනුවත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ඇය හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලයේ තවදුරටත් සේවය කිරීම ගැටලුකාරී විය හැකි බැවින්, වහාම ක්‍රියාත්මක වන පරිදි ඇයව වෙනත් පාසලක් වෙත තාවකාලිකව අනුයුක්ත කිරීමට කලාප අධ්‍යාපන බලධාරීන් පියවර ගෙන ඇති බවත් සඳහන් කර ඇත.

තව ද, මෙම විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව කරුණු දක්වමින් 2026.04.20 වන දිනැති ලිපිය මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය දන්වා ඇත්තේ, අදාළ මූලික විමර්ශන කටයුතු මේ වන විට අවසන් කර ඇති බවයි. ඒ අනුව, වගඋත්තරකාර ඩබ්.ඒ.කේ. රණතුංග මිය විසින් සිදු කරන ලද ක්‍රියාව සම්බන්ධයෙන් ඇයට තදින් තරවටු කිරීමට පියවර ගෙන, ඇයව වෙනත් පාසලක් වෙත ස්ථාන මාරු කිරීමට නිර්දේශ කර ඇති බවයි. එකී නිර්දේශය ප්‍රකාරව සහ පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවතින නඩුකරයේ තීන්දුවට යටත්ව, ඇයව ගිරි/ ගල්දෙණිය කණිෂ්ට විද්‍යාලය වෙත ස්ථාන මාරුවක් ලබා දී ඇති බව ද වැඩිදුරටත් වාර්තා කර ඇත

<u>නිරීක්ෂණ -</u>

1. පැමිණිලිකාර පාර්ශවය විසින් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද මිනිත්තු 02යි තත්පර 25ක කාලසීමාවකින් යුත් වීඩියෝ දර්ශන පටය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. විදුහල්පති කාර්යාලය තුළ දෙමාපියන් ඉදිරියේ විදුහල්පතිවරයා විසින් සිසුන් සිව්දෙනෙකුගෙන් (04) කරුණු විමසන ආකාරය එහි නිරූපණය වන අතර, සිසුන්ගේ පෞද්ගලිකත්වය සහ අනන්‍යතාවය සුරකෙන පරිදි දර්ශන ඔවුන්ගේ මුහුණු නිරාවරණය නොවන සේ පසුපසින් පටිගත කර තිබීමත්, එම අවස්ථාවට සහභාගී වී සිටින නියෝජ්‍ය විදුහල්පතිනිය ඇයගේ ඇඳුම සහ පාද දර්ශනය වීම මඟින් හඳුනාගත හැක.

එම වීඩියෝව තුළ කරුණු දක්වන සිසුන් විසින් ප්‍රකාශ කර සිටින පරිදි, බ්‍රහස්පතින්දා දින අදාළ ගුරුවරිය පන්තිය තුළ රැඳී සිටිමින් සිසුන්ට ශබ්ද නොකරන ලෙසත්, අසුන්වලින් නොනැගිටින ලෙසත් නියෝග කර ඇති පසුබිමක, වින්දිත උදන්ත ශිෂ්‍යයාගේ පෑනක් බිම වැටීම හේතුවෙන් එය

ඇඟිද ගැනීමට ඔහු ගත් උත්සාහයේදී ගුරුවරිය ඔහුට දිගින් දිගටම පහර දුන් බව සඳහන් කරයි. තවද, සිකුරාදා දින අසල පන්තියක ජ්‍යෙෂ්ඨ සිසුන් පිරිසක් ශබ්ද කරමින් සිටියදී ඔවුන්ට එරෙහිව කිසිදු පියවරක් ගැනීමට කටයුතු නොකළ ගුරුවරිය, 6බී පන්තියට පැමිණ කිසිදු වරදක් නොකළ වින්දිත ශිෂ්‍යයාට පමණක් ඉලක්කගතව මරණීය තර්ජන කරමින් ඔහු පොලිසියට භාර දෙන බව ප්‍රකාශ කළ බවත්, සෙසු සිසුන්ට කිසිදු දෝෂාරෝපණයක් සිදු කර නොමැති බවත් එම සිසුන් ප්‍රකාශ කරන බව නිරීක්ෂණය වේ.

2. එසේම, වින්දිත ශිෂ්‍යයා දඹදෙනිය මූලික රෝහල වෙත ඇතුළත් කර සායන අංක 197/2025 යටතේ 2025.09.08 සහ 2025.09.11 යන දිනවලදී වෛද්‍ය ප්‍රතිකාර ලබාගෙන ඇති බව ද මෙහිදී නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, මෙම පහරදීම සහ තර්ජනය කිරීම් හේතුවෙන් දරුවා නින්දෙන් බියවීම හා තැතිගැනීම වැනි පශ්චාත් ව්‍යසන ආතති ලක්ෂණ පෙන්නුම් කළ බැවින් මෙලෙස රෝහල්ගත කිරීමට පියවර ගත් බවත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලේ සඳහන් කර ඇත.

3. වින්දිත කේ.ඒ. උදාන්ත ඊෂාන් කස්තුරි (වයස අවුරුදු 12) සිසුවාට 2025.08.28 වන දින පන්ති කාමරය තුළදී වගඋත්තර අනෝමා රණතුංග ගුරුතුමිය විසින් පහර දුන් බවට එල්ල වූ චෝදනාවේ දී , ඇය සිය ප්‍රකාශය මඟින් සිසුවාගේ පිට ප්‍රදේශයට පොතකින් පහර දුන් බව පිළිගෙන ඇත. එහෙත්, වින්දිත සිසුවා සහ වීඩියෝ සාක්ෂි මඟින් කරුණු ඉදිරිපත් කරන සෙසු සිසුන්ගේ ප්‍රකාශවලට අනුව, ඇය විසින් සිසුවාගේ හිසට බර සහිත පොතකින් පහර දී ඇති අතර කම්මුල් පහරවල් ද එල්ල කර ඇති බව පෙනී යයි. පහරදීමෙන් පසු දරුවාට ඇති වූ හිසේ වේදනාව සඳහා පන්ති භාර ගුරුතුමිය විසින් 'සිද්ධාලේප' ලබා දීම තුළින් දරුවා කිසියම් ශාරීරික පීඩාවකට පත්ව ඇති බව තහවුරු වේ.

4. වගඋත්තර ගුරුවරිය විමර්ශන අවස්ථාවේදී කරුණු දක්වමින්, පෙර දින සවස වින්දිත සිසුවා තමාට 'හූ' තැබූ බව සිහිපත් වූ බැවින් සිසුවා අසලට ගොස් *"ඔයා මට හූ කිව්වා නේද? මීට පස්සේ මේ වගේ වැඩ කළොත් පොලිසියට කියනවා"* යනුවෙන් අවවාද කිරීමක් පමණක් සිදු කළ බව සඳහන් කර ඇත. කෙසේ වුවද, වින්දිත සිසුවා විසින් ලබා දෙන ලද සවිස්තරාත්මක ප්‍රකාශය සහ ඉදිරිපත් වී ඇති වීඩියෝ සාක්ෂි පිරික්සීමේදී, ගුරුවරිය 6-ඒ පන්තියේ ඉගැන්වීම් කටයුතුවල නිරතව සිටියදී පවා වින්දිත සිසුවා සිටි පන්තියට පැමිණ ද්වේෂසහගත ආකාරයෙන් මරණීය තර්ජන කරමින් බැණ වැදී ඇති බව නිරීක්ෂණය වේ. මෙහිදී ගුරුවරිය සහ පැමිණිලිකාර පාර්ශවය අතර පවතින පෞද්ගලික ආරවුලක් පන්ති කාමරය තුළට රැගෙන එමින්, ගුරුවරයෙකු ලෙස තමා සතු බලය අයුතු ලෙස භාවිතා කර 12 හැවිරිදි දරුවෙකු මානසික භීතියකට පත් කිරීමට වගඋත්තරකාරිය කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින්, ගුරුවරිය සිය ක්‍රියාව අවවාද කිරීමක් ලෙස සාධාරණීකරණය කිරීමට උත්සාහ කළ ද, මෙම තර්ජනය කිරීම් හේතුවෙන් දරුවා නින්දෙන් බියවීම වැනි පශ්චාත් ව්‍යසන ආතති (PTSD) ලක්ෂණ පෙන්නුම් කිරීමත්, ඒ වෙනුවෙන් දඹදෙනිය මූලික රෝහලෙන් නේවාසිකව ප්‍රතිකාර ලැබීමට සිදුවීමත් තුළින් දරුවාට සිදු වූ මානසික හානිය පිළිඹිබු වේ.

5. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද වීඩියෝ පටය තුළ, සිද්ධිය ඇසින් දුටු සෙසු සිසුන් කිසිදු පැකිලීමකින් තොරව ගුරුවරියගේ පහරදීම සහ තර්ජනාත්මක හැසිරීම විදුහල්පතිවරයා ඉදිරියේ ඉදිරිපත් කරනු ලබයි. වගඋත්තරකාරිය මෙම පහරදීම *"අධ්‍යයන කටයුතු සඳහා පෙළඹවීමක්"* ලෙස හුවා දැක්වීමට උත්සාහ කළ ද, ඇයගේ පෞද්ගලික අමනාපය දරුවා මත මුදා හැර ඇති බව පෙනී යයි.

6. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 12/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව, පාසල් සිසුන්ගේ අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා හෝ විනය පාලනය කිරීම සඳහා ශාරීරික

වේදනාවක් ඇති වන අයුරින් දඬුවම් පැමිණවීම සපුරා තහනම් කර ඇත. මෙම චක්‍රලේඛයේ ඇති තීරණාත්මක ප්‍රතිපාදනය වන්නේ, සිසුවෙකු තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතුව වුව ද, කිසිදු ශිෂ්‍යයෙකුට ශාරීරිකව පීඩනයක් හෝ වේදනාවක් ඇති විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් ගුරුවරුන් වැළකී සිටිය යුතු බවයි. එනම්, දඬුවම් කිරීමට දරන උත්සාහය පිටුපස ඇති අරමුණ කුමක් වුවත්, ශාරීරික හිංසනය භාවිතා කිරීම නීතියෙන් අනුමත නොකරන බව මෙහිදී පැහැදිලිව අවධාරණය කර ඇත.

මෙවැනි නිශ්චිත නියෝගයක් පවතින පසුබිමක, වගඋත්තරකාර අනෝමා රණතුංග ගුරුතුමිය විසින් වින්දිත සිසුවාගේ හිසට බර සහිත පොතකින් පහර දීම සහ කම්මුල් පහරවල් එල්ල කිරීම තුළින් මෙම චක්‍රලේඛය උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ. වගඋත්තරකාරිය සිය ප්‍රකාශය මඟින් සිසුවාගේ පිට ප්‍රදේශයට පොතකින් පහර දුන් බව පිළිගෙන ඇති අතර, එය දරුවා අධ්‍යයන කටයුතු සඳහා පොළඹවා ගැනීමේ චේතනාවෙන් සිදු කළ බව පවසා ඇත. එහෙත්, අංක 12/2016 චක්‍රලේඛය මඟින් අවධාරණය කරන පරිදි, අධ්‍යයන කටයුතු සඳහා පෙළඹවීමේ හෝ විනය රැකීමේ සද්භාවී අරමුණක් පැවතිය ද, ශාරීරික දඬුවම් භාවිත කිරීම කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකි බවයි.

තවද, මෙම පහරදීම හේතුවෙන් දරුවාට ක්ලාන්ත ගතිය, පෙනීමේ අපහසුතාවය සහ පශ්චාත් ව්‍යසන ආතති ලක්ෂණ ඇති වීම තුළින් පෙනී යන්නේ අදාළ ගුරුවරිය විසින් දරුවා වෙත ශාරීරික හා මානසික හිංසනයක් පමුණුවා ඇති බවයි. ඒ අනුව, විනය පාලනය සඳහා ශාරීරික දඬුවම් වෙනුවට උපදේශනය සහ ධනාත්මක විනය කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කළ යුතු බවට වූ 12/2016 චක්‍රලේඛ විධිවිධාන වගඋත්තරකාරිය විසින් නොසලකා හැර ඇති බව නිරීක්ෂණය වේ.

7. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 2012/37 දරන චක්‍රලේඛය මඟින් "ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය සහ පොදු නීති මාලාව" පැහැදිලිව දක්වා ඇත. මෙම චක්‍රලේඛයේ අන්තර්ගත මූලික නෛතික සංකල්පයක් වන්නේ, ගුරුවරුන් පාසල තුළදී ශිෂ්‍යයන්ගේ "ස්ථානීය දෙමාපියන්" (In Loco Parentis) ලෙස කටයුතු කිරීමට බැඳී සිටින බවයි. මෙම සංකල්පයට අනුව, දරුවා පාසලේ රැඳී සිටින කාලසීමාව තුළ ඔහුගේ ආරක්ෂාව, කායික හා මානසික සුවය මෙන්ම පෞරුෂ වර්ධනය සහතික කිරීමේ පූර්ණ වගකීම ගුරුවරයා සතු වේ.

කෙසේ වුවද, මෙහි දී අනාවරණය වන කරුණු අනුව, වගඋත්තරකාර අනෝමා රණතුංග ගුරුතුමිය එම ව්‍යවස්ථාපිත සහ සදාචාරාත්මක වගකීම පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ. පන්ති කාමරය තුළදී සිසුවෙකුට පොතකින් හිසට පහර දීම, කම්මුල් පහරවල් එල්ල කිරීම සහ පන්තියේ සෙසු සිසුන් ඉදිරියේ මරණීය තර්ජනය කරමින් බැණ වැදීම, "ස්ථානීය දෙමාපියෙකු" ලෙස ගුරුවරයෙකුගෙන් බලාපොරොත්තු වන ආදරය, රැකවරණය සහ මානුෂීය ගුණයට පටහැනි ක්‍රියාවන් වේ.

තවද, 2012/37 චක්‍රලේඛය මඟින් අවධාරණය කරන්නේ ශිෂ්‍යයාගේ සුබසිද්ධියට හා ගරුත්වයට හානි වන අයුරින් කටයුතු කිරීම ගුරු වෘත්තියේ ගෞරවයට හානි කරන විෂමාචාරයක් බවයි. වගඋත්තරකාරිය සහ පැමිණිලිකාර පාර්ශවය අතර පවතින පෞද්ගලික ඉඩම් ආරවුලක් පන්ති කාමරය තුළට රැගෙන එමින්, 12 හැවිරිදි දරුවෙකු ඉලක්ක කර ගනිමින් සිදු කළ මෙම ප්‍රචණ්ඩකාරී හැසිරීම තුළින් ඇය සිය වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

4. වගඋත්තරකාරිය දරුවා සොයා යමින් තර්ජනය කිරීම හේතුවෙන් දරුවාගේ *"උපරිම යහපත"* සුරක්ෂිත කිරීමට පාසල් පරිපාලනය විසින් එම පන්තියේ ඉගැන්වීම් කටයුතු වලින් ඉවත් කිරීම හා කලාප අධ්‍යාපන කාර්යාල බලධාරීන් විසින් තාවකාලික ස්ථාන මාරු වීම් ලබා දීම හරහා යහපත් මැදිහත්වීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

5. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 308 (අ) වගන්තිය ප්‍රකාරව ළමයින් කෲරත්වයට භාජනය කිරීම නීති විරෝධී සහ දණ්ඩනීය වරදක් වන බවත්, 311 (ඇ) වගන්තිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ (UNCRC) පළමුවන වගන්තිය මඟින් වයස අවුරුදු 18 ට අඩු සෑම පුද්ගලයෙකුම "ළමයෙකු" ලෙස අර්ථ දක්වා ඇති අතර, ඔවුන් වෙත එම ප්‍රඥප්තියේ සඳහන් සියලුම මූලික අයිතිවාසිකම් හිමි විය යුතු බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව, වින්දිත කේ.ඒ.උදන්ත ඒෂාන් කස්තුරි දරුවා වයස අවුරුදු 12ක පසුවන්නෙකු බැවින්, ඔහු ඉහත සඳහන් සියලුම දේශීය හා ජාත්‍යන්තර නෛතික ආරක්ෂාවන් සහ හිමිකම් ලැබීමට පූර්ණ අයිතිය සහිත දරුවෙකු වේ.

6. ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (UNCRC) 28(2) වගන්තිය මඟින්, පාසල් තුළ විනය පාලනය කිරීමේ ක්‍රියාවලිය සෑම විටම දරුවාගේ ගෞරවයට හා අභිමානයට අනුකූල වන පරිදි සිදු කළ යුතු බව අවධාරණය කර ඇත. මෙම ජාත්‍යන්තර මූලධර්මය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 12/2016 දරන චක්‍රලේඛයේ 2.2 උප වගන්තිය මඟින් ද දේශීය නෛතික රාමුව තුළ පිළිගෙන තහවුරු කර තිබේ. ඒ අනුව, ළමයින්ට එරෙහිව සිදු කෙරෙන කිසිදු ආකාරයක ශාරීරික හෝ මානසික හිංසනයක් වළක්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් පනවා ඇති ප්‍රමිතීන්ගෙන් බැහැර වීමට කිසිදු ව්‍යතිරේකී තත්ත්වයකට ඉඩ නොලැබෙන බවත්, එම ආරක්ෂාව සම්මුතියේ 19 වන වගන්තිය මඟින් තවදුරටත් ප්‍රතිඥා දී ඇත.

7. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෑතකදී නිකුත් කරන ලද අංක 11/2026 දරන චක්‍රලේඛය මඟින් පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් වධහිංසාව ශුන්‍ය කිරීමේ ප්‍රතිපත්තිය පැහැදිලිව ප්‍රකාශයට පත් කර ඇත. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට සෘජුවම පදනම් වී ඇත්තේ ***ලලිත බණ්ඩාර එදිරිව රම්‍යා ද සිල්වා (SC/FR 461/2012)*** යන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවයි. එම නඩු තීන්දුවේ 17 වන ඡේදය මඟින් අවධාරණය කර ඇති පරිදි, දඬුවම් කිරීමේ ක්‍රමයක් ලෙස හෝ වෙනත් කිසිදු හේතුවක් මත කිසිදු දරුවෙකුට ශාරීරික හෝ මානසික හානියක් සිදු නොකළ යුතු බවත්, එවැනි ක්‍රියාවල නිරත වන වගකිවයුත්තන්ට එරෙහිව නීතිය තදින්ම ක්‍රියාත්මක කළ යුතු බවත් මෙම චක්‍රලේඛය මඟින් සියලුම ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට නියෝග කර ඇත.

මෙම නෛතික පසුබිම තුළ, වගඋත්තරකාර අනෝමා රණතුංග ගුරුතුමිය විසින් වින්දිත සිසුවාගේ හිසට පොතකින් පහර දීම මඟින් 11/2026 චක්‍රලේඛය මඟින් තහනම් කර ඇති 'ශාරීරික හානිය' සිදු කර ඇති බවත්, පසුව ඔහුට මරණීය තර්ජනය කරමින් පන්තියේ අනෙක් සිසුන් ඉදිරියේ මානසික පීඩනයකට පත් කිරීම තුළින් එම චක්‍රලේඛය මඟින්ම වළක්වා ඇති මානසික බලපෑමක් සිදු කර ඇති බවත් පෙනී යයි. විශේෂයෙන්ම, 11/2026 චක්‍රලේඛයට පදනම් වූ ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව, ගුරුවරයෙකු විසින් දරුවෙකුට සිදු කරන පහරදීමක් පමණක් නොව, ඔහු වෙත එල්ල කරන අවමන් සහගත ප්‍රකාශයන් සහ තර්ජනය කිරීම් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන වධහිංසාකාරී ක්‍රියාවක් ලෙස නිරීක්ෂණය වේ.

ඒ අනුව, වගඋත්තරකාරිය විසින් වින්දිත දරුවා ඉලක්ක කර ගනිමින් සිදු කරන ලද මෙම ප්‍රචණ්ඩකාරී සහ තර්ජනාත්මක හැසිරීම් රටාව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවා ඇති ඉහත සඳහන් නියෝග සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සහතික කර ඇති ළමා ආරක්ෂක මූලධර්ම නොසලකා හරිමින් සිදු කරන ලද්දක් බව පෙනී යයි.

8. ශාරීරික දඬුවම් මඟින් දරුවෙකුගේ මානසික සෞඛ්‍යයට සහ පෞරුෂ වර්ධනයට සිදු කෙරෙන අගතිය සම්බන්ධයෙන් ***හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර සිරිවර්ධන [SC/FR/97/2017]*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුව අතිශය තීරණාත්මක වේ. එහිදී එස්. තුරෙයිරාජා විනිසුරුතුමා අවධාරණය කළේ, 'තුවාල' (Injuries) යන්නට හුදෙක් ශාරීරික

හානි පමණක් නොව, දණ්ඩ නීති සංග්‍රහයේ පවා පිළිගෙන ඇති පරිදි 'මානසික හෝ මනෝවිද්‍යාත්මක කම්පනයන්' (Psychological or mental trauma) ද සෘජුවම ඇතුළත් වන බවයි. දරුවෙකු යනු ගුරුවරුන්ගේ හෝ පාලනාධිකාරියේ දේපළක් නොව, තමන්ගේම අභිමානයක් සහ ස්වාධීනත්වයක් සහිත මානව හිමිකම්වල හිමිකරුවෙකු බවත්, විනය පාලනය කිරීමේ මුවාවෙන් දරුවාගේ මානසික ගරුත්වයට හානි කිරීම කිසිසේත් අනුමත කළ නොහැකි බවත් එහිදී පෙන්වා දෙන ලදී. තවද, වැඩිහිටියෙකුට 'සුළු පහරක්' ලෙස හැඟෙන ක්‍රියාවක් බාලවයස්කරුවෙකුගේ සංවේදී මානසිකත්වයට බරපතල හානි සිදුකළ හැකි බැවින්, දරුවෙකුගේ මනෝ-සමාජීය යහපැවැත්මට එල්ල වන ඕනෑම ප්‍රහාරයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන වධහිංසාවක් ලෙස සැලකීමට මෙම නඩු තීන්දුව මගින් ප්‍රබල පූර්වාදර්ශයක් සපයයි.මෙම නෛතික ස්ථාවරය වර්තමාන පැමිණිල්ලේ සඳහන් වින්දිත දරුවාට සිදු වූ අගතිය සම්බන්ධයෙන් ද සෘජුවම අදාළ වේ.

***සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව [(1989) 2 SLR 393]*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුව මෙහිදී සුවිශේෂී වැදගත්කමක් ගනී. එම නඩුවේදී ආචාර්ය අමරසිංහ විනිසුරුතුමා විසින් පෙන්වා දෙන ලද්දේ, 11 වන වගන්තිය මගින් අපේක්ෂිත ආරක්ෂාව හුදෙක් ශාරීරිකව පමණක් සීමා නොවන බවයි. එනම්, *'11 වන වගන්තිය මගින් අපේක්ෂිත සැලකිල්ල ශාරීරික හිංසනයේ ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී, එය පුද්ගලයෙකුගේ ආත්මය හෝ මනස යන ක්ෂේත්‍රයන් ද ආවරණය කරනු ලබයි'* ("The treatment contemplated by Article 11 wasn't confined to the realm of physical violence. It would rather embrace the sphere of the soul or mind as well.").

මෙම මූලධර්මය වත්මන් පැමිණිල්ලට අදාළ කර බැලීමේදී, වින්දිත දරුවාට එල්ල කරන ලද ශාරීරික පහරදීමට අමතරව, මරණීය තර්ජනයන් මගින් දරුවාගේ මනසට සහ ආත්ම අභිමානයට බලපෑමක් සිදුව ඇත. 12 හැවිරිදි වියේ පසුවන දරුවෙකුගේ පෞරුෂයට එල්ල වූ මෙම හානිය, ඉහත පූර්වාදර්ශයට අනුව දරුවාගේ 'ආත්මයට සහ මනසට' සිදු වූ හානියක් ලෙස සැලකිය හැකි බැවින්, එය 11 වන වගන්තිය යටතේ ගැනෙන කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක් ලෙසින් සැලකිය හැකිය.

එමෙන්ම, ***විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත (SC FR App No. 677/2012)*** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා වැදගත් නිරීක්ෂණයක් සිදු කර ඇත. එහිදී අධිකරණය අවධාරණය කළේ, වැඩිහිටියෙකුට අදාළ වන 'බරපතල මට්ටමේ හිංසනය' පිළිබඳ නිර්ණායකය සෑම විටම බාලවයස්කරුවෙකුගේ මානසික තත්ත්වය (**Mental constitution**) හා සමපාත නොවන බවත්, දරුවෙකු අවමන් සහගත සැලකීම් පිළිබඳව පැමිණිලි කරන අවස්ථාවක අධිකරණය එහි **'ඉහළ භාරකරු'** ලෙස ක්‍රියා කරමින් එම ක්‍රියාව මගින් දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට සිදු වූ බලපෑම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බවත්ය. ඒ අනුව, වර්තමාන පැමිණිල්ලේ වින්දිත දරුවා වෙත පන්ති කාමරය තුළ සෙසු සිසුන් ඉදිරියේ එල්ල කළ මරණීය තර්ජනය මගින් දරුවාගේ මනසට ඇති කළ බලපෑම, ඉහත පූර්වාදර්ශයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක් බව පෙනී යයි.

මීට අමතරව, ***පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ සහ තවත් අය (SC Application No. 190/94)*** නඩු තීන්දුව ද මෙම සිදුවීමට සෘජුවම අදාළ වේ. එහිදී පාසල් ශිෂ්‍යයෙකුට ගුරුවරුන් විසින් පහර දීම සහ "තමුසේ" වැනි වචන භාවිත කරමින් ප්‍රසිද්ධියේ අපහාස කිරීම හේතුවෙන් එම දරුවා බරපතල මානසික බිඳවැටීමකට ලක්ව මාසයක් පුරා මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා තිබුණි. එහිදී අධිකරණය තීරණය කළේ ගුරුවරුන් විනය පාලනය කිරීමට උත්සාහ කරන අවස්ථාවන්හිදී ක්‍රියා කරන්නේ රජයේ නිල බලය යටතේ බැවින්, ඔවුන් සිදු කරන මානසික හා ශාරීරික හිංසනයන් සඳහා රජය සහ අදාළ නිලධාරීන් වගකීමට බැඳී සිටින බවයි.

ඉහත සඳහන් සියලුම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට අනුව, මෙම සිදුවීමේදී ද වින්දිත දරුවා වෙත එල්ල කරන ලද පහරදීම හා වාචික බැන වැදීම හා මරණ තර්ජනය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ ගැනෙන "කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක්" ලෙස සැලකිය හැකි බව නිරීක්ෂණය වේ.

**<u>නිගමනය</u>**

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ පාර්ශවකරුවෙකු ලෙස දරුවන්ට වධහිංසාවෙන් තොර ආරක්ෂිත අධ්‍යාපන පරිසරයක් සහතික කිරීමට නෛතිකව බැඳී සිටියි. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 12/2016, 2012/37 සහ නව අංක 11/2026 දරන චක්‍රලේඛ මඟින් පාසල් පද්ධතිය තුළ ශාරීරික දඬුවම් පැමිණවීම සපුරා තහනම් කර ඇති අතර, විශේෂයෙන්ම 11/2026 චක්‍රලේඛය මඟින් පනවා ඇති වධහිංසාව ශුන්‍ය කිරීමේ ප්‍රතිපත්තිය මෙම පැමිණිල්ල තුළ උල්ලංඝනය වී ඇති බව පෙනී යයි.

පළමුවන වගඋත්තරකාර අනෝමා රණතුංග ගුරුතුමිය විසින් වින්දිත සිසුවාගේ හිසට බර සහිත පොතකින් පහර දීම සහ කම්මුල් පහරවල් එල්ල කිරීම මඟින් ***<u>හේවා මද්දුමගේ කරුණාපාල එදිරිව ඒ. ජයන්ත ප්‍රේම කුමාර [SC FR 97/2017]</u>*** නඩුවේදී තහවුරු කළ පරිදි නීති විරෝධී ශාරීරික හිංසනයක් සිදු කර ඇත. තවද, ඇය විසින් පන්ති කාමරය තුළදී සිදු කරන ලද "තෝ මරනවා" වැනි මරණීය තර්ජනයන් සහ අවමන් සහගත ප්‍රකාශයන්, **<u>විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත [SC FR 677/2012] සහ සිල්වා එදිරිව පොහොර සංස්ථාව [1989]</u>** යන නඩු තීන්දු ප්‍රකාරව දරුවාගේ "ආත්මයට සහ මනසට" එල්ල කරන ලද දරුණු හිංසනයක් ලෙස සැලකිය හැකිය. මෙම ක්‍රියාවන් හේතුවෙන් දරුවා පශ්චාත් ව්‍යසන ආතති ලක්ෂණ (PTSD) පෙන්නුම් කරමින් රෝහල්ගත වීමට සිදුවීම තුළින් තහවුරු වන්නේ ඇය සිය "ස්ථානීය දෙමාපිය" වගකීම පැහැර හැර ඇති බවයි.

ඒ අනුව, පළමුවන වගඋත්තරකාරිය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ <u>11 වන වගන්තිය</u> මඟින් සහතික කර ඇති "*කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය*" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

මෙම සිද්ධියෙන් අනතුරුව දෙවන වගඋත්තරකාර විදුහල්පතිවරයා සහ පාසල් පරිපාලනය විසින් වින්දිත දරුවාට සිදු විය හැකි අගතිය අවම කිරීම උදෙසා අදාළ ගුරුවරිය එම පන්තියේ ඉගැන්වීම් කටයුතුවලින් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගෙන ඇති අතර, එය 'දරුවාගේ උපරිම යහපත' සුරක්ෂිත කිරීම වෙනුවෙන් සිදු කරන ලද සාධාරණ මැදිහත්වීමක් ලෙස නිරීක්ෂණය කරයි. එමෙන්ම, තෙවන වගඋත්තරකාර කලාප අධ්‍යාපන කාර්යාලය ද සිය රාජකාරිමය වගකීම ඉටු කරමින්, අදාළ සිද්ධිය පිළිබඳ මූලික පරීක්ෂණයක් සිදුකර ගුරුවරිය වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව, දෙවන සහ තෙවන වගඋත්තරකාර පාර්ශවයන් පවතින පරිපාලනමය රාමුව තුළ සිය වගකීම් ඉටු කර ඇති බැවින්, ඔවුන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුකර නොමැති බව නිගමනය කරමු.

**<u>නිර්දේශ</u>**

ඒ අනුව, පහත නිර්දේශ ඉදිරිපත් කරයි.

1. පළමුවන වගඋත්තරකාර අනෝමා රණතුංග ගුරුවරිය විසින් සිදු කරන ලද මෙම පහරදීම සහ බිය ගැන්වීමේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සුදුසු පරීක්ෂණයක් කර, ඒ අනුව සුදුසු පියවර ගත යුතුය.
2. වින්දිත දරුවාට සිදු වූ ශාරීරික හා මානසික අගතිය වෙනුවෙන් පළමුවන වගඋත්තර අනෝමා රණතුංග විසින් පෞද්ගලිකව රුපියල් **10,000.00** ක වන්දි මුදලක් වින්දිත දරුවා වෙත ගෙවිය යුතුය.

2026 .06.24 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු( හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| පිටපත : | 1. අමාත්‍යතුමිය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය, බත්තරමුල්ල | - | කරුණු දැන ගැනීම සඳහා. |
| | 2. ලේකම්<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය, බත්තරමුල්ල | - | නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා |